පුවත් වාර්තා කිරීමේදී මාධ්‍ය වගකීම වන්නේ, නිවැරදිව මූලාශ්‍ර ඔස්සේ සොයාගත් කරුණු සහ තොරතුරු මත පදනම් ව, අපක්ෂපාතී ආකාරයකින් පුවත් වාර්තා කිරීම නොවේදැයි පාඨක අප ඇසිය යුතු පැනයකි. එහිදී එම පුවත ඉදිරිපත් කරන මාධ්‍යවේදියෙකු එම පුවත සම්බන්ධයෙන් දරණ හැඟීම් හෝ පක්ෂපාතීත්වයන් පුවතට කාන්දු නොවිය යුතුවේ.

තම දියණියට ලිංගික අතවර කර, මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කළ සිය පුත්‍රයා ඝාතනය කර නීතියෙන් සැඟවෙමින් සිටි බවට පැවසෙන සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීමේ පුවත, සිළුමිණ හා ඉරිදා ලංකාදීප (ජූලි 30, 2023) පුවත්පත් තුළ පළ වී තිබූ ආකාරය, මෙහිදී විමසා බැලිය හැක.

* මෙම පුවත් වාර්තාවන් හි සිරස්තල තුළ එම සැකකරුවාව හඳුන්වා දී තිබුණේ "නරුම පියෙකු" සහ "නරුම තාත්තා" යන විශේෂණයන් යොදමිනි.

ඔබ සිතන ලෙසට,

1) "නරුම" වැනි විශේෂණයන් සමඟින් සැකකරුවන් සම්බන්ධයෙන් සඳහන් කිරීම අවශ්‍ය ද?

2) මෙම පුවත් වාර්තාවන්, කරුණු මත පමණක් පදනම්ව, මෙම ලිපි ලියූ මාධ්‍යවේදීන්ට හෝ, ලිපි වලට සිරස්තල යෙදූ සංස්කාරකවරුන්ට මෙම සිදුවීම සම්බන්ධයෙන් ඇති හැඟීම් හෝ පක්ෂපාතීත්වයන් පුවතට කාන්දු නොවන ලෙසින් ඉදිරිපත් කළ යුතු නොවේද? මෙම පුවත් වාර්තාවන් එසේ ඉදිරිපත් කර ඇතැයි ඔබ සිතන්නේද?

3) එසේම "කෙලෙසීම" වැනි යෙදුම් ඔස්සේ ලිංගික අපරාධයක් හැඳින්වීමෙන්, ලිංගික අපරාධයට ලක්වූ අය අපවිත්‍ර වී ඇති බවට අදහසක් ගම්‍ය වන හෙයින්, ඒ වෙනුවට 'ලිංගික අපයෝජනය' හෝ 'ලිංගික අපරාධය' වැනි යෙදුම් සුදුසු නොවන්නේ ද?

මෙම කරුණ සම්බන්ධයෙන් අප මින් පෙර ඉදිරිපත් කළ පෝස්ටුවකට ප්‍රවේශය මෙතනින්:
**https://www.facebook.com/photo?fbid=252950180829585&set=a.225081980283072**

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!